*සැ. යු.* - (i) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2010 වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.

(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2011.12.31 දිනෙන් අවසන් වන වර්ෂයට අදාළ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ නාමාවලියක් පළ වේ.

(iii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2012.12.31 දිනෙන් අවසන් වන වර්ෂයට අදාළ ශ්‍රී ලංකාවේ විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන්ගේ නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,821 - 2013 ජූලි මස 26 වැනි සිකුරාදා - 2013.07.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 646 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 646 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 647 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 648 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 654 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.*- (i) මර්කස් සකාෆතුල් ඉස්ලාමියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 ජූනි මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(ii) ර/කුරුවිට මධ්‍ය මහා විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 ජූනි මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අගෝස්තු මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අගෝස්තු මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 232

MOD/DEF/09/26/BCONF/NCC/02.

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

*2013 ජනවාරි මස 01 වැනි දින සිට බ්‍රවේ කර්නල් වශයෙන් :*

1. නි/3007 තා/බ්‍රවේ කර්නල් එස්ඩී සූරියකුමාර
2. නි/3008 තා/බ්‍රවේ කර්නල් ඩීඑස් අබේගුණසේකර
3. නි/3018 තා/බ්‍රවේ කර්නල් වයිජ්එස්කේ ජයසිංහ
4. නි/3026 තා/බ්‍රවේ කර්නල් එම්ආර්ඩබ්එම්බීජීපීකේබීආර් මිල්ලවාන
5. නි/3029 තා/බ්‍රවේ කර්නල් ඩබ්ජ්එස් අබේරත්න
6. නි/3053 තා/බ්‍රවේ කර්නල් එච්එම්එස්බී හේරත්
7. නි/3055 තා/බ්‍රවේ කර්නල් එච්පීජීජ් අල්විස්

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

07-674/1

2013 අංක 233

MOD/DEF/9/26/BCONF/NCC/02.

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

*2013 ජුනි මස 01 වැනි දින සිට බ්‍රවේ කර්නල් වශයෙන් :*

01. නි/3023 තා/බ්‍රවේ කර්නල් කේපීපී චන්ද්‍රලතා (ගැ)
02. නි/3254 තා/බ්‍රවේ කර්නල් ඒඩීඑම්ඩී බණ්ඩාර

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

07-674/2

2013 අංක 234

MOD/DEF/9/26/BCONF/NCC/02.

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

*2013 අප්‍රේල් මස 01 වැනි දින සිට බ්‍රවේ ලුතිතන් කර්නල් වශයෙන් :*

1. නි/3028 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් බීඩීසී ජයවර්ධන
2. නි/3064 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් එම්ජීපී රාමනායක
3. නි/3149 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් ඩබ්ජ්එල්අයි වීරසිංහ(ගැ)
4. නි/3158 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් එස්ජ් හේවාවිතාරණ
5. නි/3255 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් එස්සීජේ රූපසිංහ (ගැ)
6. නි/3441 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් යූඩීජ් ධර්මසේන
7. නි/3442 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් ආර්යුකේ රාජපක්ෂ
8. නි/3463 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් ජීඑම්එස් පෙරේරා(ගැ)
9. නි/3514 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් අයිපීඑල්ඩී ආනන්ද
10. නි/3450 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් එල්පී මෙන්ඩිස්
11. නි/3489 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් එම්ඩබ්එන් සෝමසිරි
12. නි/3236 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් එම්ජ් වීරවංශ
13. නි/3160 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් එන්ජ් සිරිසේන
14. නි/3511 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් පීඩබ්එම්ජ් වික්‍රමසිංහ
15. නි/3646 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් කේබීජේකේජ්පී අල්විස්
16. නි/3627 තා/බ්‍රවේ ලුතිතන් කර්නල් එල්ජීපී ලියන්ගස්කුඹුර

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

07-674/3

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 235

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ඊ. එම්. එස්. බී. ඒකනායක මහතා 2013 ජූලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි.

07-717

# රජයේ නිවේදන

## 2013 යල කන්නය

### අඹේවෙල ව්‍යාපාරයේ කන්න රැස්වීම් වාර්තාව

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹේවෙල ව්‍යාපාරයේ 2013 යල කන්නය සඳහා කන්න රැස්වීම 2013.06.27 වැනි දින අඹේවෙල ව්‍යාපාර ඒකක කාර්යාලයේ දී පවත්වන ලදී. එහි දී පහත තීරණ ගන්නා ලදී.

| | | | |
|---|---|---|---|
| 1. | වගා කරන බිම් ප්‍රමාණය | - | අක්කර 595 |
| 2. | වගා කරන භෝග | - | අර්තාපල්/මිශ්‍ර එළවළු |
| 3. | ප්‍රධාන ඇල ශුද්ධ කර අවසන් කරන දිනය | - | 2013.06.05 ට පෙර |
| 4. | පළමු ජල මුරය නිකුත් කරන දිනය | - | 2013.06.20 |
| 5. | බිම් සකස් කිරීම | - | 2013.06.05 ට පෙර |
| 6. | භෝග සිටුවා අවසන් කරන දිනය | - | 2013.07.22 ට පෙර |
| 7. | අවසන් ජල මුරය නිකුත් කිරීම | - | 2013.09.30 |
| 8. | ඇලවේලි ශුද්ධ නොකරන අයට දඩය | - | රු. 800 (මීටර් 10ක් සඳහා) |
| 9. | දෙවන වරට සියලුම ඇල වේලි ශුද්ධ කිරීම | - | රු. 2013 අගෝස්තු දෙවන සතිය |
| 10. | අස්වනු නෙලා අවසන් කිරීම | - | 2013.10.30 |

11. අවශ්‍යතාවය අනුව ජල හිඟයක් ඇති වූ විට මුර ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තීරණය විය.
12. අඹේවෙල ව්‍යාපාරයෙන් අනවසරයෙන් ජලය ලබාගන්නා ගොවීන්ගේ නාම ලේඛනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබී ඇති බැවින්, එම නාම ලේඛනය අනුව අනවසර ජල මාර්ග ඉවත් කිරීම සුදුසු බව තීරණය කරන ලදී.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම් - වැලිමඩ.

2013 ජූලි මස 05 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-678

---

## 2013 යල කන්නය

### දඹවින්න ව්‍යාපාරයේ කන්න රැස්වීම් වාර්තාව

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දඹවින්න ව්‍යාපාරයේ 2013 යල කන්නය සඳහා කන්න රැස්වීම 2013.06.27 වැනි දින දඹවින්න, මැදගෙදරගම සමූපාකාර රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී. එහි දී පහත තීරණ ගන්නා ලදී.

| | | | |
|---|---|---|---|
| 1. | වගා කරන බිම් ප්‍රමාණය | - | අක්කර 225 |
| 2. | වගා කරන භෝගය | - | උඩරට එළවළු |
| 3. | ඇලවේලි ශුද්ධ කර අවසන් කරන දිනය | - | 2013.06.30 දිනට පෙර |
| 4. | පළමු ජල මුරය නිකුත් කරන දිනය | - | 2013.07.05 |
| 5. | බිම් සකසා භෝග සිටුවා අවසන් කරන දිනය | - | 2013.07.15 |
| 6. | ජල මුරය ක්‍රියාත්මක කිරීම | - | 2013.07.04 |
| 7. | යල කන්නයේ අවසානය | - | ජල කාලසටහන අනුව |

8. නියමිත දිනයට ඇල වේලි ශුද්ධ කිරීම අවසන් කල පසුව ප්‍රථම ජල මුරය නිකුත් කරන බවට තීරණය විය.
9. කෙත් ඇල වේලි ශුද්ධ කිරීමේ වගකීම ගොවි සංවිධාන නිලධාරීන් වෙත පැවරී ය.
10. යල කන්නයේ දී ගොවීන් වැඩි පිරිසක් එළවළු වගා කරන බැවින්, වී වගාව සඳහා ලබා දුන් පොහොර සහනාධාරය එළවළු වගාව සඳහාත් ලබා දීම සුදුසු බවට තීරණය විය.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2013 ජූලි මස 03 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-677

---

## 2013 යල කන්නය

### කන්දෙඇල ව්‍යාපාරයේ කන්න රැස්වීම් වාර්තාව

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දෙඇල ව්‍යාපාරයේ 2013 යල කන්නය සඳහා කන්න රැස්වීම 2013.06.17 වැනි දින අඹේවෙල වාරිමාර්ග කාර්යාලයේ දී පවත්වන ලදී. එහි දී පහත තීරණ ගන්නා ලදී.

| | | |
|---|---|---|
| 1. | වගා කරන බිම් ප්‍රමාණය | - ව්‍යාපාරයේ මුළු වපසරය |
| 2. | වගා කරන භෝගය | - අර්තාපල්/මිශ්‍ර එළවළු |
| 3. | ඇලවේලි ශුද්ධ කර අවසන් කරන දිනය | - 2013.06.30 දක්වා |
| 4. | පළමු ජල මුරය නිකුත් කරන දිනය | - 2013.06.20 |
| 5. | වගාවන් සඳහා භූමිය සකස් කිරීම | - 2013.06.20 සිට 2013.06.30 දක්වා |
| 6. | භෝග සිටුවා අවසන් කරන දිනය | - 2013.07.15 |
| 7. | අවසන් ජල මුරය නිකුත් කිරීම | - 2013.10.15 |
| 8. | ඇලවේලි ශුද්ධ නොකරන අයට දඩය | - දිනක වැටුප (රු. 750 වේ) |
| 9. | කන්නය ඇතුළත දෙවන වරට ඇලවේලි ශුද්ධ කිරීම | - 2013 අගෝස්තු මුල් සතිය |
| 10. | අස්වනු නෙලා අවසන් කරන දිනය | - 2013.10.30 |

11. නියමිත දිනට ඇලවේලි ශුද්ධ නොකරන ගොවීන් සඳහා දඩ මුදල් අය කිරීම වාරිමාර්ග ආඥාපනත හා ගොවිජන සේවා පනත අනුව කටයුතු කිරීම
12. අනවසර වගාකරුවන් පිළිබඳ නිවැරදි තොරතුරු ග්‍රාම නිලධාරි මගින් ලබා ගත යුතු බවට තීරණය විය.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම් - වැලිමඩ.

2013 ජූලි මස 03 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-676

### කුරුණෑගල (වයඹ) කතෝලික රදගුරු පදවියේ කට්ටිමහන - සාන්ත ආනා ජාතික සිද්ධස්ථානයේ 118 වැනි වාර්ෂික මංගල්‍යය

ඉහත සඳහන් උත්සවය 2013 අගෝස්තු මස 16 වැනි දින ආරම්භ කර 2013 අගෝස්තු මස 29 වැනි දින අවසන් කරන බව සහ මංගල උත්සවය අගෝස්තු 24 සහ 25 යන දෙදින සිදු කරන බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

වන්දනා ගමන් ආඥාපනත යටතේ ප්‍රසිද්ධියට පත් කර ඇති රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුල වලංගු වනවා ඇත.

ඩී. ඒ. නයනානන්ද,
ප්‍රාදේශීය ලේකම්,
උඩුබද්දාව.

2013 ජුලි මස 02 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-709

ඩීඑස්/එම්එන්/එස්එස්/සීයුඑල්/04/2013.

### වන්දනා ගමන් ආඥාපනත මඩ/අමිර්තකලි ශ්‍රී මාමාංග පිල්ලයාර් කෝවිල - වාර්ෂික උත්සවය 2013

මඩකලපුව දිස්ත්‍රික්කය

යථොක්ත උත්සවය 2013 ජුලි මස 28 වැනි දින ආරම්භ වී 2013.08.06 වැනි දින දක්වා පවත්වනු ලබන බව උත්සවයට වන්දනා සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියලු දෙනාගේම දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1948.07.16 වැනි දින අංක 9886 දරන ආණ්ඩුවේ ගැසට් නිවේදනය සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේ දී එකී උත්සවයට පැමිණෙන සියල්ලන්ගෙන් හා අනෙකුත් අයගේ අවධානය මෙයින් යොමු කරවමි.

එස්. ගිරිදරන්,
ප්‍රාදේශීය ලේකම්,
මන්මුනේ උතුර,
මඩකලපුව.

2013 ජුලි මස 03 වැනි දින,
මන්මුනේ උතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-789

## ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

### ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මුල්‍ය ප්‍රකාශන 2011

**දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය**

| | *2011 දෙසැ. 31 දිනට රු.* | *2010 දෙසැ. 31 දිනට රු.* |
|---|---|---|
| (ඉලක්කම් ආසන්න රුපියලට ගලපා ඇත) | | |
| **වත්කම්** | | |
| *ජංගම නොවන වත්කම්* | | |
| දේපල පිරියත හා උපකරණ | 1,165,544,613 | 1,138,250,257 |
| කෙරීගෙන යන වැඩ | 58,942,353 | 3,732,551 |
| ආයෝජන | 187,644,943 | 101,245,208 |
| *ජංගම වත්කම්* | | |
| ගබඩා තොගය | 36,480,816 | 26,569,101 |
| විවිධ ණයගැතියෝ සහ ලැබිය යුතු දෑ | 126,472,516 | 115,999,898 |
| සේවක ණය සහ අත්තිකාරම් | 83,705,195 | 71,759,856 |
| අත්තිකාරම් හා ඉදිරියට කළ ගෙවීම් | 93,875,597 | 71,324,287 |
| තැන්පතු- මහා භාණ්ඩාගාරය | - | 24,700,000 |
| මුදල් හා මුදල් සමාන විෂයයන් | 106,036,470 | 94,678,878 |
| **උප එකතුව** | **446,570,594** | **405,032,019** |
| **වත්කම් එකතුව** | **1,858,702,503** | **1,648,260,035** |
| **ස්කන්ධය හා වගකීම්** | | |
| *සකන්ධ ප්‍රාග්ධනය* | | |
| මූලධන ආධාර - වැයවූ | 2,267,552,520 | 2,060,956,367 |
| මූලධන ආධාර - වැය නොවූ | (6,222,331) | 10,394,592 |

| | *2011 දෙසැ. 31 දිනට රු.* | *2010 දෙසැ. 31 දිනට රු.* |
|---|---|---|
| මූල ධන ආධාර - වාහන (අය වැය චක්‍රලේඛ - 150) | 16,319,167 | - |
| විශේෂ ව්‍යාපෘති IRQUE (IDA Credit - 3781CE) | 138,044,944 | 138,044,944 |
| රාජ්‍ය අරමුදල් නොවන අරමුදල් තුලින් ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය | 20,910,902 | - |
| ත්‍යාග හා පරිත්‍යාග | 367,371,710 | 367,753,029 |
| | 2,803,976,912 | 2,577,148,933 |
| **සමුච්චිත අරමුදල** | | |
| පොදු සංචිතය | (1,619,814,533) | (1,526,773,190) |
| **ජංගම නොවන වගකීම්** | | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 278,847,683 | 265,123,699 |
| **සංචිත හා අරමුදල්** | | |
| විශේෂ සංචිත | 10,514,109 | 7,360,157 |
| මූලධන සංචිතය | 25,694,931 | 25,694,931 |
| අනුස්මරණ අරමුදල් | 25,439,223 | 19,458,209 |
| විවිධ ව්‍යාපෘති සහ පර්යේෂණ ආධාර | 27,715,777 | 7,246,904 |
| විලම්භිත ආදායම - ස්වයං මූල්‍ය හා ව්‍යාපෘති | 161,102,965 | 161,530,617 |
| | 250,467,006 | 221,290,819 |
| **ජංගම වගකීම්** | | |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 29,319,794 | 27,977,056 |
| උපචිත වියදම් | 65,596,460 | 67,051,123 |
| ගෙවිය යුතු දෑ | 50,309,180 | 16,441,596 |
| | 145,225,435 | 111,469,776 |
| **ස්කන්ධය හා වගකීම්වල එකතුව** | **1,858,702,503** | **1,648,260,035** |

| අත්සන් කලේ : | අත්සන් කලේ : | අත්සන් කලේ : |
|---|---|---|
| ආචාර්‍ය එන්. එල්. ඒ. කරුණාරත්න | කේ. ජී. බ්‍රිටෝ | ජී. අයි. එන්. පැස්කුවල් |
| උපකුලපති | ලේඛකාධිකාරී | මූල්‍යාධිකාරී |

2012 ජූලි මස 31 වැනි දින.

2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශනය
*(ඉලක්කම් ආසන්න රුපියලට ගලපා ඇත)*

| | *2011 රු.* | *2010 රු.* |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | |
| රජයේ ආධාර - පුනරාවර්තන | 1,109,447,000 | 954,990,000 |
| රජයේ ආධාර - මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | 8,750,000 | 10,526,509 |
| ශ්‍රී.ල.වි.වි. ක්‍රීඩා තරඟාවලිය සඳහා වි. ප්‍ර. කො. අතිරේක ප්‍රතිපාදන | - | 5,000,000 |
| ශිෂ්‍යාධාර | 33,238,400 | 48,499,600 |
| මෝටර් වාහන විකුණුම් මත ලාභය | 2,172,500 | - |
| මහපොළ ශිෂ්‍යත්ව | 85,629,250 | 146,697,600 |
| අභ්‍යන්තර ආදායම් | 154,760,570 | 175,021,719 |
| පරිත්‍යාග ක්‍රමක්ෂය | 1,759,771 | 44,907,656 |
| වාහන ප්‍රදාන ක්‍රමක්ෂය | 1,130,833 | - |
| රාජ්‍ය අරමුදල් නොවන අරමුදල් තුලින් ප්‍රාග්ධන වියදම් ක්‍රමක්ෂය | 4,002,058 | - |
| ස්වයං මූල්‍ය පාඨමාලා ආදායම් | 45,514,309 | 27,258,641 |
| **මුළු ආදායම** | **1,446,404,691** | **1,412,901,727** |

| | *2011* *රු.* | *2010* *රු.* |
|---|---|---|
| **මෙහෙයුම් වියදම්** | | |
| සේවක වැටුප් හා දීමනා | 923,550,151 | 760,632,788 |
| ගමන් වියදම් | 6,777,591 | 4,925,505 |
| සැපයීම් | 55,889,342 | 62,424,027 |
| නඩත්තු සේවා | 8,729,946 | 7,508,371 |
| කොන්ත්‍රාත් සේවා | 184,833,115 | 158,329,080 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 76,750,313 | 94,872,352 |
| **ක්ෂයවීම්** | 149,661,229 | 133,703,223 |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 9,706,015 | 10,526,509 |
| ශිෂ්‍යාධාර | 33,238,400 | 48,499,600 |
| මහපොළ ශිෂ්‍යත්ව | 85,629,250 | 146,697,600 |
| ස්වයං මූල්‍ය පාඨමාලා වියදම් | 21,467,845 | 22,244,365 |
| **මුළු වියදම්** | **1,556,233,198** | **1,450,363,421** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ඌනතාවය | **(109,828,507)** | **(37,461,694)** |

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | *2011.12.31 දිනට (රු.)* | *2010.12.31 දිනට (රු.)* |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ඌනතාවය/අතිරික්තය | (109,828,507) | (54,248,859) |
| **ගැලපීම්** | 149,661,229 | 133,703,223 |
| මෝටර් වාහන විකුණුම් මත ලාභය | (2,172,500) | - |
| මෝටර් වාහන විකුණුම් ප්‍රතිෂ්ඨාව | 2,172,500 | - |
| ආයෝජන පොලී | (5,661,203) | - |
| විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම | 35,609,932 | 28,568,426 |
| පරිත්‍යාග ක්‍රමක්ෂය | (1,759,771) | (44,907,656) |
| වාහන ප්‍රදාන ක්‍රමක්ෂය | (1,130,833) | - |
| රාජ්‍ය අරමුදල් නොවන අරමුදල් තුලින් ප්‍රාග්ධන වියදම් ක්‍රමක්ෂය | (4,002,058) | - |
| වත්කම් කපා හැරීම | 43,766 | |
| පෙර වර්ෂ ගැලපීම් | 16,787,164 | (80,863,555) |
| රජයේ ආධාර - මූලධන වත්කම් පුනරුත්ථාපනය වැඩිදියුණු කිරීම | (8,750,000) | - |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **70,969,718** | **(17,748,422)** |
| ගබඩා තොගය (වැඩිවීම/අඩුවීම) | (9,911,714) | (2,849,490) |
| ණයගැතියෝ සහ ලැබිය යුතු (වැඩිවීම/අඩුවීම) | (8,567,174) | (1,266,521) |
| සේවක ණය හා අත්තිකාරම් (වැඩිවීම/අඩුවීම) | (11,945,339) | (17,453,850) |
| අත්තිකාරකම් හා පෙර ගෙවීම් (වැඩිවීම/අඩුවීම) | (22,551,310) | 47,722,321 |
| මූලධන වෙන්කිරීම (වැඩිවීම/අඩුවීම) | - | (734,406) |
| උපචිත වියදම් (වැඩිවීම/අඩුවීම) | (1,454,663) | 24,433,289 |
| ආපසු ගෙවිය යුතු තැන්පත් (වැඩිවීම/අඩුවීම) | 1,342,738 | (5,796,822) |
| තැන්පතු - මහා භාණ්ඩාගාරය (වැඩිවීම/අඩුවීම) | - | 1,042,095 |
| අනෙකුත් ජංගම වගකීම් (වැඩිවීම/අඩුවීම) | 33,867,584 | (346,599) |
| කාරක ප්‍රාග්ධන වෙනස් වීමෙන් පසු ඇතිවූ මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **51,749,840** | **(15,998,405)** |

| | *2011.12.31 දිනට (රු.)* | *2010.12.31 දිනට (රු.)* |
|---|---|---|
| පාරිතෝෂික ගෙවීම | (21,885,948) | (11,635,108) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **29,863,892** | **(27,633,513)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම | (134,618,710) | (89,561,767) |
| ආයෝජන පොලී | 3,755,759 | - |
| කෙරීගෙන යන වැඩ | (55,209,802) | - |
| ආයෝජන | (86,399,735) | (44,074,254) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **(272,472,488)** | **(133,636,021)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| මූලධන ආධාර | 189,000,000 | 92,000,000 |
| තැන්පතු - මහා භාණ්ඩාගාරය | 24,700,000 | - |
| තොරතුරු තාක්ෂණ ආධාර (වි.ප්‍ර.කො) - ව්‍යවහාරික විද්‍යා පීඨය | 1,500,000 | 3,000,000 |
| තොරතුරු තාක්ෂණ ආධාර (වි. ප්‍ර. කො) - කළමණාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | - | 3,000,000 |
| තොරතුරු තාක්ෂණ ආධාර (වි.ප්‍ර.කො.) පුස්තකාලය | - | 1,000,000 |
| පිහිනුම් තටාකය සඳහා ආරක්ෂක වැට සහ දාගැබ ඉදිකිරීම | 6,000,000 | - |
| කාර්යමණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම් | 3,590,000 | - |
| අනුස්මරණ අරමුදල් | 5,981,014 | 4,303,468 |
| විශේෂිත අරමුදල් | 3,153,952 | 29,348 |
| පර්යේෂණ අරමුදල් | 20,468,873 | (389,695) |
| ව්‍යාපෘති පාඨමාලා | (427,652) | 20,841,546 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **253,966,187** | **123,784,668** |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වලින් සිදුවූ ශුද්ධ වෙනස | 11,357,592 | (37,484,866) |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් වලට සමාන දෑ (සටහන1) | 94,678,878 | 132,163,744 |
| කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් වලට සමාන දෑ (සටහන 1) | **106,036,470** | **94,678,878** |

**සටහන 1**

| මුදල් හා මුදල් වලට සමාන දෑ විග්‍රහය | *2011.12.31 දිනට (රු.)* | *2010.12.31 දිනට (රු.)* |
|---|---|---|
| භාණ්ඩාගාර අරමුදල් | | |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-6-2315454 (පුනරාවර්තන ආධාර) | 24,573,405 | 5,701,170 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-3-2315455 (මූලධන ආධාර) | 467,097 | 9,011,552 |
| මහජන බැංකුව, ආයතනික ශාඛාව - ගි/අ 004-1-001-0-0210877 | 7,045,545 | 29,101 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001 - 9 -2315457 (වෛද්‍ය පීඨය) | 2,676,849 | 2,183,856 |
| **උප එකතුව** | **34,762,896** | **16,925,679** |
| භාණ්ඩාගාර නොවන අරමුදල් | | |
| මහජන බැංකුව, ගංගොඩවිල -ගි/අ 097-1-001-8-2315467 (පශ්චාද් උපාධි පීඨය) | 14,630,608 | 13,937,994 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-165-0034200 (සංවර්ධන අරමුදල) | 170 | 170 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-6-2315473 (සීඩා සරෙක්) | 1,388,034 | 1,388,034 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-4-2315474 (සීඩා සරෙක්) | 601,789 | 575,276 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-8-2315472 (ශිෂ්‍ය සහන අරමුදල) | 77,240 | 140,723 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-1-2315456 (බාහිර විභාග ඒකකය) | 21,809,462 | 36,185,762 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-7-0000629 (50 වන සංවත්සර අරමුදල් ගිණුම) | 108,200 | 108,220 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-4-0002229 (කළමනාකරණ පීඨ සංවර්ධන අරමුදල) | 24,967,329 | 18,295,210 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-5-0005005 (ශාස්ත්‍ර පීඨ අරමුදල) | 5,409,633 | 5,033,335 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-4-7709343 (සංවර්ධන අරමුදල - වෛද්‍ය පීඨය) | 2,153,167 | 1,894,013 |
| | **71,145,653** | **77,558,739** |

| | *2011.12.31 දිනට* | *2010.12.31 දිනට* |
|---|---|---|
| **සුළු මුදල් අග්‍රිමය** | | |
| පොදු ගිණුම | 66,457 | 106,704 |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ ගිණුම | 39,069 | 23,634 |
| වෛද්‍ය පීඨ ගිණුම | 3,338 | - |
| 21 වෙනි ශත වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය | 6,000 | - |
| බාහිර විභාග ඒකකය | 13,057 | 13,122 |
| උප එකතුව | **127,920** | **143,460** |
| මුදල් සංචිතය | - | 51,000 |
| එකතුව | **106,036,470** | **94,678,878** |

2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා

**මූල්‍ය වාර්තාවල අදාළ සටහන්**

**වැදගත් ගිණුම් ප්‍රතිපත්ති**

1. *පොදු*

විශ්ව විද්‍යාලයේ මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන සකස් කර ඇත. වත්කම් අත්පත් කර ගන්නා දිනට පවත්නා වටිනාකම අනුව ගණුදෙනු සටහන් කර ඇති අතර, වගකීම දැරීම හා අරමුදල් ලැබීම සාමාන්‍ය පිළිගත් ගිණුම්කරන ප්‍රතිපත්තීන්වලට අනුකූලව පෙර වර්ෂයන්හි භාවිතා කළ ක්‍රමවලට අනුකූලව සිදුකර ඇත.

1.1 *සංසන්දනාත්මක තොරතුරු*

පවත්නා වර්ෂයේ ශේෂයන් වර්ගීකරණය හා ඉදිරිපත් කිරීම සංසන්දනාත්මක ලෙස තහවුරු කිරීම සඳහා පෙර වර්ෂයට අදාළ ශේෂයන් නැවත වර්ගීකරණය කර ඉදිරිපත් කර ඇත.

2. වත්කම් හා එහි වටිනාකම් ගණනය කිරීමේ පදනම

2.1 *දේපල, පිරියත, උපකරණ හා ක්ෂය*

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ශුද්ධ අගයට පෙන්වා ඇත. සියලුම වත්කම් මිලදී ගත් පිරිවැය සහ අනෙකුත් වියදම් වටිනාකමට සටහන් කර ඇත. පරිත්‍යාග වශයෙන් ලැබෙන වත්කම්හි වටිනාකම් එහි පිරිවැය මත ගණනය කර ඇත.

ශ්‍රී.ල.ගි. ප්‍ර. අංක 24 ට අනුව පරිත්‍යාග ලෙස ලද දේපල පිරියත හා උපකරණවල වටිනාකම ප්‍රාග්ධනය කර හා එහි ඵලදායී ආයු කාලය මත ක්‍රමක්ෂය කර ඇත. (සටහන් 12)

වත්කම්වල ඵලදායී ජීවකාලය තුළ පිරිවැය කපා හැරෙන පරිදි පහත සඳහන් රේටයන්ට අනුව වාර්ෂිකව සරල මාර්ග ක්‍රමයට වත්කම් ක්ෂය කරනු ලැබේ.

| | |
|---|---|
| ඉඩම් | - |
| ගොඩනැගිලි - සවිකිරීම් ඇතුළුව | 5% |
| ලී බඩු හා සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| පොත් හා වාර සඟරා | 20% |
| මෝටර් රථ | 20% |
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 20% |
| උපාධි ලෝගු | 20% |
| ක්‍රීඩා භාණ්ඩ | 20% |
| අනෙකුත් ස්ථාවර වත්කම් (ජල සැපයුම්, විදුලි හා දුරකථන) | 10% |

2.1 (ඒ)

විශ්ව විද්‍යාලය විසින් ඉපයීම් අරමුදල් හා වෙනත් ව්‍යාපෘති අරමුදල්වලින් මිලදී ගත් දේපල පිරියත හා උපකරණයන් හි වටිනාකම "රාජ්‍ය අරමුදල් නොවන අරමුදල් තුළින් ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය" යටතේ පෙන්වා ඇත.

2.1 (බී)

ලීසිං පහසුකම් යටතේ ලබාගත් රු. 17,450,000 ක් වටිනා මෝටර් රථ 04 ක් මෝටර් රථ යටතේ පෙන්වා ඇත. මුදල් චක්‍ර ලේඛ අංක 8/2011 (අයවැය චක්‍රලේඛ අංක 150-මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය) අනුව ලීසිං වාරික මහා භාණ්ඩාගාරය විසින් ගෙවනු ලැබේ.

2.1 (සී)

විශ්වවිද්‍යාලයට තාරුණ්‍යයට හෙටක් ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 85 ක් පමණ වටිනා පිහිනුම් තටාකය 2010 වසරේ දී ආධාර ලෙස ලැබී ඇත. රාජ්‍ය තක්සේරු ආයතනයෙන් පිහිනුම් තටාකයේ නිවැරැදි වටිනාකම, ප්‍රාග්ධනිත කිරීම සඳහා ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

2.2 *තොගය*

ගබඩා තොග වටිනාකම ගණනය කිරීම සඳහා පළමුවෙන් ලැබීම්, පළමුවෙන් නිකුත් කිරීමේ ක්‍රමය අනුගමනය කරනු ලැබේ. ගබඩා තොග භෞතික වශයෙන් ගණනය කර ශේෂ පත්‍ර දිනට වටිනාකම ගණනය කරනු ලැබේ.

2.3 සේවකයින්ට ගෙවනු ලබන ණය සහ අත්තිකාරම්

සේවකයින්ගෙන් අයකර ගැනීමට නියමිත ණය මුදල ලැබිය යුතු මුදල ලෙස ගණනය කර ඇත.

3. *පාරිතෝෂික සඳහා වෙන් කිරීම*

විශ්ව විද්‍යාල සේවයේ වර්ෂ 05ක සේවා කාලයක් ඇති කාර්යය මණ්ඩලය සඳහා පමණක් පාරිතෝෂික ගණනය කර වෙන් කිරීම් කරනු ලැබේ. මෙම වෙන් කිරීම සඳහා අභ්‍යන්තර වශයෙන් අරමුදල් පිහිටුවා ඇත.

4 *උපචිත හා වගකීම් සඳහා වෙන් කිරීම*

ඇස්තමේන්තු හා ලැබී ඇති ලිපිලේඛනවල තොරතුරු මත උපචිත හා වගකීම් සඳහා වෙන් කිරීම් කරනු ලැබේ.

5. *ලැබිය යුතු දෑ*

ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම වෙනුවෙන් 2011.12.31 දිනට රු. 87,908,801 ක මුදලක් කාර්ය මණ්ඩලයෙන් අයකර ගැනීමට ඇත.

6. *ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් වීම*

ඇප බැඳුම්කර කඩවීම මගින් ලැබිය යුතු හා ලැබුණු මුදල්වල ස්වභාවය සලකා බැලූ පාලක සභාව ගිණුම් ප්‍රතිපත්තිය 2011 ජනවාරි 01 දින සිට උපචිත පදනම වෙනුවට මුදල් පදනම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට තීරණය කළහ. ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීම මත ඇප බැඳුම්කරවල බලපෑම පහත දක්වා ඇත.

| | *දැනට පවත්නා ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව රු. ශ.* | *නව ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව රු. ශ.* |
|---|---|---|
| ඇප බැඳුම්කර මගින් ආදායම | 10,690,291 | 1,377,128 |
| ඇප බැඳුම්කර ලැබිය යුතු ආදායම | 87,908,802 | 78,595,639 |

7. *ආධාර සඳහා ගිණුම්කරණය*

පුනරාවර්තන ආධාර, ආදායම් හා වියදම් මුදල් පදනම මත හඳුනාගෙන ඇත. ස්ථාවර වත්කම් පුනරුත්ථාපන පිරිවැය, ඉදිකිරීම් සහ නව ව්‍යාපෘති කෙරීගෙන යන වැඩ හෝ ස්ථාවර වත්කම් ලෙස අවශ්‍ය පරිදි හඳුනාගෙන ඇත.

8. *ආදායම හඳුනාගැනීම*

8.1 පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර, ශිෂ්‍යාධාර හා මහපොළ මුදල් පදනම මත හඳුනාගැනේ.

8.2 ශ්‍රී.ල.ගි.ප්‍ර 29 (ආදායම) අනුව අදාළ කාර්ය නිමවන ප්‍රතිශතය පදනම් කරගෙන ස්වයං මුල්‍ය පාඨමාලාවන්හි ඉපයීම අදාළ පාඨමාලා පවත්නා කාලය සඳහා හඳුනා ගැනේ.

**තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

එච්. ඒ. එස්. සමරවීර,
විගණකාධිපති.

07-692

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - ගන්දර ශාඛාව**
**(කලින් රුහුණ සංවර්ධන බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

2008 අංක 14 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 40 වැනි වගන්තිය මගින් බලාත්මක කරන ලද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයට අනුව පිහිටවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව, සබරගමුව සංවර්ධන බැංකුව, කඳුරට සංවර්ධන බැංකුව, ඌව සංවර්ධන බැංකුව, වයඹ සංවර්ධන බැංකුව, සහ රජරට සංවර්ධන බැංකු ඒකාබද්ධ කොට පිහිටවනු ලැබූ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2010.10.21 දින පවත්වන ලද ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. එන් කොත්තාගොඩ මහත්මිය විසින් සහතික කරන ලද 2009.06.25 දිනැති අංක 1522 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කෝට්ටගොඩ, පාතෙගම "ඉසුරු" ලිපිනයේ පදිංචි දිලිත් ශ්‍රීපාලි කොළඹගේ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් අටලක්ෂ දාහත්දහස් හැට තුනයි ශත අනූ හතක මුදල (රු. 8,17,063.97) හා 2010.09.15 දින සිට වෙන්දේසි දිනය දක්වා වර්ෂයකට 27.5% බැගින් රුපියල් හය ලක්ෂ පනස් දෙදහස් හාරසියයක මුදල (රු. 6,52,400) ක මුදල සඳහා අදාල පොලිය ද, රුපියල් පන්ලක්ෂ පනස් හත් දහස් නමසිය විසිපහයි ශත තිස් හතරක මුදල (රු. 5,57,925.34) ක් හා 2010.09.15 දින සිට වෙන්දේසි දිනය දක්වා වාර්ෂිකව 25% ක පොලී අනුපාතිකය යටතේ රුපියල් හාරලක්ෂ පනස් තුන්දහස් අටසීයයක (රු.4,53,800) ක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා ද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 1552 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

**දේපල පිළිබඳ විස්තර**

ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. මානවඩු මහතා සහතික කළ අංක 805 හා 1996.01.18 දිනැති විකුණුම්කරය මගින් අයිතිව නිරවුල්ව භුක්ති විඳගෙන එන, දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, පාතේගම පිහිටි වඩුගෙහේනෙවත්ත නමැති ඉඩම බෙදා අංක 09 දරන කැබැල්ලෙන් බෙදූ අංක 05 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු එම්. විමලසූරිය මහතා විසින් මැන සම්පාදිත අංක : 3074 බී හා 1990.03.11 දිනැති සැළැස්ම ප්‍රකාර බෙදූ 5A සහ 05B දරන කැබලි ඒකාබද්ධ ඉඩම වන උතුරට : මෙම ඉඩමේ අංක 04 දරන කැබැල්ල ද, නැගෙනහිරට : කිරිමඩුවත්ත ද, දකුණට : ගම් සහා පාර ද, බස්නාහිරට : මෙම ඉඩමේ අංක 06 (පාර) දරන ඉඩම් කැබැල්ල ද, යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි, පර්චස් විසි අටයි දශම හයයි අටයි දෙකයි පහක් (අ. 0, රූ. 02, පර්. 28.6825) ක් විශාල ඉඩමේ සියලුම ගසකොළ, පළතුරු සමග සම්පූර්ණ බිම ද වේ.

එකී ඉඩම මාතර, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 445/257 හි ලියාපදිංචි වී ඇත.

එකී පාතේගම පිහිටි වඩුගෙහේනෙ වත්ත නැමති ඉඩම බෙදා වෙන් කරන ලද අංක 09 දරන කැබැල්ලෙන් බෙදූ අංක 05 දරන කැබැල්ල, බලයලත් මිනින්දෝරු, එම්. විමලසූරිය මහතා විසින් මැන සම්පාදිත අංක 3074 බී හා 1990.03.11 දිනැති සැළැස්ම ප්‍රකාර බෙදූ 05A සහ 05B දරන කැබලි ඒකාබද්ධ ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. එස්. යාපා මහතා විසින් මැන සම්පාදිත අංක 4442 හා 2007.09.29 දිනැති සැළැස්ම ප්‍රකාර බෙදූ "ඒ" අක්ෂරය දරන කැබැල්ලට මායිම්, උතුරට මෙම ඉඩමේ අංක 04 දරන කැබැල්ල ද, නැගෙනහිර කිරිමඩුවත්ත ද, දකුණට පාතෙගම සිට ගොඩඋඩට දිවෙන ගම් සහා පාර ද, බස්නාහිරට : මෙම ඉඩමේ අංක 06 (පාර) දරන ඉඩම් කැබැල්ල ද, යන මායිම් තුළ රූඩ් දෙකයි, පර්චස් විසි අටයි, දශම හයයි අට (අ. 0, රූ. 02, පර්. 28.68) ක් විශාල ඉඩමේ සියලුම ගසකොළ, පළතුරු සමග සම්පූර්ණ බිම ද, එහි පිහිටි සියළු ගොඩනැගිලි ද වේ.

එකී ඉඩම මාතර, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 635/226 වං 44/112 හි 2009.06.26 දින ලියාපදංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සාමාන්‍යාධිකාරී.

2013 මැයි මස 13 වැනි දින,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
දකුණු පළාත් කාර්යාලය,
පඹුරණ, මාතර.

07-660

පීවී 60441.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " ටෙම්පල් කෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2007.07.03" දින සංස්ථාපිත සමාගමක් වන "ටෙම්පල් කෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ටෙම්පල් කෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන, වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. එන්. ආර්. සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2013 ජූලි මස 05 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-793

---

පීවී 60513.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " එෆ් ඇන්ඩ් ආර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2007.07.03" දින සංස්ථාපිත සමාගමක් වන "එෆ් ඇන්ඩ් ආර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "එෆ් ඇන්ඩ් ආර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන, වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. එන්. ආර්. සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2013 ජූලි මස 05 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-794

පීවී 21706.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " මැජෙස්ටික් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "1998.07.31" දින සංස්ථාපිත සමාගමක් වන "මැජෙස්ටික් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "මැජෙස්ටික් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන, වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. එන්. ආර්. සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2013 ජූලි මස 05 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-816

---

පීවී 60482.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " ඩෙල්ටා ගාඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ "2007.06.29" දින සංස්ථාපිත සමාගමක් වන "ඩෙල්ටා ගාඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ඩෙල්ටා ගාඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන, වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. එන්. ආර්. සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2013 ජූලි මස 05 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-792

පීවී 60475.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " ගවනර්ස් ඇපරල් සොසිං (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ ''2007.06.29'' දින සංස්ථාපිත සමාගමක් වන "ගවනර්ස් ඇපරල් සොසිං (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ගවනර්ස් ඇපරල් සොසිං (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන, වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. එන්. ආර්. සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2013 ජූලි මස 05 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-795

---

පීවී 60484.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ " ෆොටෝ ඩිසයින් පික්චර් පෝස්ට් කාඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ ''2007.06.29'' දින සංස්ථාපිත සමාගමක් වන "ෆොටෝ ඩිසයින් පික්චර් පෝස්ට් කාඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ෆොටෝ ඩිසයින් පික්චර් පෝස්ට් කාඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන, වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. එන්. ආර්. සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2013 ජූලි මස 05 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-796

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

2013.04.06 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම සහ ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. වී. අන්දරවැව විසින් සහතික කරන ලද 2011.05.10 දිනැති අංක 1647 දරන උකස් බැඳුම්කරය අනුව 2013.02.12 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් හැට ලක්ෂ හැට දෙදහස් හයසිය හැත්තෑ තුනයි ශත හතලිස් අටක (රු. 60,62,673.48) මුදල සමග රුපියල් හතලිස් නව ලක්ෂ අසූ එක් දහස් එකසිය අසූ අටයි ශත හැත්තෑ හතක (රු49,81,188.77) මුදල මත වසරකට සියයට දහතුනයි දශම පහ (13.5%) බැගින් පොළියක් 2013.02.13 වෙනි දින සිට ගෙවීම නිම කරන දින තෙක් උකුවෙල, කලල්පිටිය පාරේ, "ආලෝක" හි පදිංචි රණවීර සංජීව කොඩිතුවක්කු මහතා සහ ඉලෙකුට්ටිගේ දොන් පෙලනි ඉරේෂාද සිල්වා මහත්මියගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. වී. අන්දරවැව විසින් සහතික කරන ලද 2011.05.10 දිනැති එකී අංක 1647 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් හැට ලක්ෂ හැට දෙදහස් හයසිය හැත්තෑ තුනයි ශත හතලිස් අටක (රු. 60,62,673.48) මුදල සමග 2013.02.13 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අය කර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර ටොරිංටන් පාරේ, අංක 24 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මාතලේ උතුර පල්ලේසිය පත්තුවේ, පාදෙනියෙහි පිහිටි කටුපත්යාය නමැති ඉඩමෙන් රූඩ් එකක බිම් ප්‍රමාණයකට බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් සාදන ලද 1995.02.04 දිනැති අංක 1305 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ කොටස එනම් එකී ලොට් 5 අංක 1305 දරන පිඹුර ප්‍රකාර උතුරට : අංක 1305 දරන පිඹුරෙහි ලොට් 4 ලෙස නිරූපණය කර ඇති එම ඉඩමෙහි ඉතිරි කොටස ද, නැගෙනහිරට : දඹුල්ලේ සිට හබරන දක්වා වූ ප්‍රධාන පාර ද, දකුණට සහ බස්නාහිරට : වින්සන්ට් පෙරේරා විසින් උරුමකම් ඉඩමද මායිම්ව එහි ඇති නිවෙස, ගහකොළ සහ සියලු දේද වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D407/226 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම පහත සඳහන් ආකාරයට මෑතකදී මනිනු ලැබ ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර පල්ලේසිය පත්තුවේ පාදෙනියෙහි පිහිටි කටුපත් යාය නමැති ඉඩමෙන් රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) බිම් ප්‍රමාණයකට බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් සාදනලද 1995.10.05 දිනැති පිඹුරු අංක 1337හි ලොට් 5 උතුරට ලෙස දක්වා සීමා නිර්ණය කොට බෙදා ඇති කොටස එනම් එකී ලොට් 5 අංක 1337 දරන පිඹුරෙහි නිරූපිත තුම්පලපිටිය ඉඩම ද, නැගෙනහිරට : හබරන සිට දඹුල්ල දක්වා මහා මාර්ගය ද, දකුණට : තම්මැන්නා ඇල ද, බස්නාහිරට : වින්සන්ට් පෙරේරා

විසින් උරුමකම් කියනු ලබන ඉඩම ද මායිම්ව එහි ඇති වගාවන් සහ සියලු දේද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. එන්. පී. ගුණසේකර,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
මාතලේ අධිශ්‍රේණි ශාඛාව.

07-753

---

## මහජන බැංකුව - මොරටුමුල්ල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.11.29 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට නීතිඥ හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද අංක 2866 සහ 2007.11.06 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම කුමාරගේ වත්තගේ චන්ද්‍රා ස්වර්ණපාල ප්‍රනාන්දු මයා සහ සීලප්පෙරුමගේ අමිතා ප්‍රනාන්දු මහත්මිය යන දෙදෙනා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 2866 දරන බැඳුම්කරය මත රුපියල් තුන්ලක්ෂ හැට දහස් එකසිය අසූ තුනයි ශත දෙකක (රු. 3,60,183.02) මුදලක් සහ රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 2,50,000) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් තුන්ලක්ෂ හැට දහස් එකසිය අසූ තුනයි ශත දෙකක (රු. 3,60,183.02) එකී මුදල ද රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 2,50,000) ක එකී මුදල ද 2009.09.12 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් තුන්ලක්ෂ හැට දහස් එකසිය අසූ තුනයි ශත දෙකක (රු. 360,183.02) මුදලක් මත වර්ෂයකට සියයට විසි හත(27%) බැගින් තවදුරටත් වූ පොලිය ද, 2009.07.31 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 2,50,000) මුදලක් මත වර්ෂයකට සියයට විසි හත (27%) බැගින් තවදුරටත් වූ පොලිය ද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29 ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 2866 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන ලද දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මොරටුව මහ නගර සභා සීමාව තුළ මොරටුමුල්ල ගමේ පිහිටියාවූ ද, "කහටගහවත්ත" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. ඡ්. ඩී. අර්සකුලරත්න විසින් සාදන ලද අංක 510 හා 2007.04.23 දින දරන පිඹුරේ ලොට් C ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : ද සොයිසා පාර ද, නැගෙනහිරට : නගර සභා පාර ද, දකුණට : දේවගේ ඒබ්‍රහම් ප්‍රනාන්දුගේ ඉඩම ද, බස්නාහිරට : අංක 1177 පිඹුරේ ලොට් B දරන කොටස ද, මායිම් වන්නාවූ ද එකී අංක 510 දරන පිඹුරට අනුව පර්චස් හතරයි දශම එකයි බින්දුවක් (අක්. 0, රූ. 0, පර්. 4.10) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස හා එහි පස හා එහි පිහිටි ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

එකී ලොට් C දරන කොටස පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමකි.

ඉහත කී මොරටුමුල්ල ගමේ පිහිටියා වූ ද, "මාදන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එන්. පී. රණසිංහ විසින් සාදන ලද අංක 1177 හා 1942.05.25 දින දරන පිඹුරේ ලොට් C ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : ද සොයිසා පාර ද, නැගෙනහිරට : නගර සභා පාර ද, දකුණට : දේවගේ ඒබ්‍රහම් ප්‍රනාන්දුගේ දේපළ ද, බස්නාහිරට : ලොට් B දරන කොටස ද, මායිම් වන්නාවූ ද, එකී අංක 1177 දරන පිඹුරට අනුව පර්චස් හතරයි දශම එකයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 4.10) විශාල වූ ද,

ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 3042/171 යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පස හා එහි පිහිටි ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 3042/171 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (කොළඹ පිටත)
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

07-812

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීම

කොළඹ 03, ගාලු පාරේ, අංක 451 හි පදිංචි එන්. මනෝහරන්ගේ වගකීම් වෙනුවෙන් උකස් කරන ලද වැල්ලවත්ත, අනුලා පාරේ, අංක 23/2 හි පිහිටි දේපළ

2013.04.26 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් බී. බී. රණසිංහ විසින් සහතික කරන ලද 1997.04.21 දිනැති අංක 3141 දරන උකස් බැඳුම්කරය අනුව 2013.02.28 වැනි දින තෙක් ණය මත මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් නව කෝටි දහසය ලක්ෂ හතලිස් දහස් හත්සිය පනස් හතරයි ශත විසි තුනක (රු. 9,16,40,754.23) මුදල සමග මුල් මුදල වන රුපියල් දෙකෝටියක (රු. 2,00,00,000) මුදල මත වසරකට සියයට දහ නමයයි දශම පහ (19.5%) බැගින් ගෙවිය යුතු පොළිය 2013.03.01 වැනි දින සිට ගෙවීම නිමකරන දිනය තෙක් කොළඹ 03, ගාලු පාරේ අංක 451 හි පදිංචි එන්. මනෝහරන් මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී අංක 3141 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් නව කෝටි දහසය ලක්ෂ හතලිස් දහස් හත්සිය පනස් හතරයි ශත විසි තුනක (රු. 9,16,40,754.23) මුදල සමග 2013.03.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට මුල් මුදල මත වසරකට සියයට දහනවයයි දශම පහ (19.5%) බැගින් වූ අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ, මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර මහත්වරුන්හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එකී සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුවේ සම්බන්ධතා කළමනාකරු හට (අයකර ගැනීම් ආයතනික) මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ කොළඹ මහ නගර සභා සීමාවේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාමංකඩ බටහිර ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ, පාමංකඩ බටහිර, වැල්ලවත්ත කොට්ඨාස අංක 46 හි වැල්ලවත්ත අනුලා පාරෙහි පිහිටි වරිපනම් අංක 23/2 දරන ගොඩනැගිල්ල ද සමග කැලන්කඩුවෙවත්ත නමැති ඉඩමට [(වැල්ලවත්ත) ලියාපදිංචි පිඹුරෙහි අංක 02 හි යාබද ලොට් සී 1, ලොට් සී 2 හි බෙදූ ඉඩම් කොටසක් වන බලයලත් මිනින්දෝරු ජේම්ස් රොඩ්රිගෝ විසින් සාදන ලද 1939 ජූලි මස 01 දිනැති අංක 3117 දරන මැනුම් පිඹුරෙහි නිරූපිත ලොට් පී හි උප බෙදීමක් වන)] බලයලත් මිනින්දෝරු ඒ. පී. එස්. ගුණවර්ධන විසින් සාදන ලද 1968 නොවැම්බර් මස 06 වැනි දිනැති අංක 134 දරන පිඹුරෙහි ලොට පී 3 ලෙස දක්වා නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල උතුරට : ලොට් පී 2 ද, නැගෙනහිරට : ලොට් 101 බී ද, දකුණට: ලොට් පී 4 ද, බස්නාහිරට : ලොට් යූ (පාරට වෙන්කළ කොටස) ද මායිම්ව අංක 134 දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම බිංදුවයි තුනක (අ. 0 රූ. 0 පර්. 15.03) ක බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර, එහි ඇති ගහකොළ, ගොඩනැගිලි ආදී සියලු දේ ද සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වැල් 192/148 හි ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය (මාර්ග අයිතිය)

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ කොළඹ මහ නගර සභා සීමාව තුළ ඉහත කී තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාමංකඩ බටහිර ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසයේ, වැල්ලවත්තේ අනුලා පාරෙහි පිහිටි කැලන්කඩුවෙවත්ත නමැති ඉඩමට [(වැල්ලවත්ත) ලියාපදිංචි පිඹුරු අංක 02 දරන පිඹුරෙහි යාබද ලොට් සී 1, හා ලොට් සී 2 හි බෙදූ ඉඩම් කොටසක් වූ)] බලයලත් මිනින්දෝරු ජේම්ස් රොඩ්රිගෝ විසින් සාදන ලද 1939 ජූලි 01 දිනැති අංක 3117 දරන පිඹුරෙහි ලොට් යූ (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල උතුරට : 65 වන පටුමග (දැන් අනුලා පාර) ද, නැගෙනහිරට : ලොට් පී ද, දකුණට : ලොට් ටී ද, බස්නාහිරට : ලොට් එස්, ආර් සහ කිව් ද මායිම්ව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වැල් 175/262 හි ලියාපදිංචි වී ඇති අතර, ඉහත කී පිඹුරු අංක 3117 ට අනුව පර්චස් දාහතයි දශම තුනයි හයක (අ. 0, රූ. 0, පර්. 17.36) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ඒ. ජී. වීරකෝන් බණ්ඩා,
සම්බන්ධතා නිලධාරී,
අයකර ගැනීමේ ආයතනික.

2013 මැයි මස 02 වැනි දින,
ලංකා බැංකුව,
අයකර ගැනීමේ ඒකකය,
අංක 1, ලංකා බැංකු මාවත,
කොළඹ 1.

07-821

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීම

2013.06.12 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. එස්. චාන්දනී මැතිව් විසින් සහතික කරන ලද 2007.07.20 දිනැති අංක 4896 දරන උකස් බැඳුම්කරය අනුව 2013.05.15 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් අනූ එක් ලක්ෂ අසූ එක් දහස් හත්සිය අසූ අටයි ශත අනූ හතරක (රු. 91,81,788.94) මුදල සමග රුපියල් පනස් අට ලක්ෂ දහතුන් දහස් හත්සිය පනස් දෙකයි ශත පනස් නවයක (රු. 58,13,752.59) මුදල මත වසරකට සියයට විස්ස (20%) බැගින් පොළියක් 2013.05.16 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් මුල්ලේරියාව නව නගරය, කැළණිමුල්ල, නාගහවෙල පාරේ, අංක 407/1 හි පදිංචි රණසිංහ ආරච්චිගේ අජිත් හේමන්ත මහතා සහ ටානියා ගිලිෂියා පොන්නම්පෙරුම මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. එස්. මැතිව් විසින් සහතික කරන ලද හා 2007.07.20 දිනැති එකී අංක 4896 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් අනූ එක් ලක්ෂ අසූ එක් දහස් හත්සිය අසූ අටයි ශත අනූ හතරක (රු. 91,81,788.94) මුදල සමග 2013.05.16 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ නගර ශාඛාවේ ශාඛා කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අඵත්කුරු කෝරලයේ, අඹතලෙන් පහළ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව (මුල්ලේරියාව උප කාර්යාලය) තුළ කැළණිමුල්ලෙහි පිහිටි නාගහවෙල පාරේ වරිපනම් අංක 123/1, දරන "කෝන්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. ඊ. විජේසූරිය විසින් සාදන ලද 2005 ජූලි 26 දිනැති අංක 342 දරන පිඹුරෙහි ලොට් ඒ ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් ඒ උතුරට : හෙන්ද්‍රික් පෙරේරාගේ ඉඩම ද, නැගෙනහිරට : අංක 1232 දරන පිඹුරෙහි ලොට් 1 බී සහ අංක 1734 දරන පිඹුරෙහි ලොට් 2 ද, දකුණට : අංක 1734 දරන පිඹුරෙහි ලොට් 2 සහ එල්. කේ. රත්නවේලිගේ ඉඩම ද, බස්නාහිරට : පාර (ප්‍රා. ස) ද මායිම්ව එකී අංක 342 දරන පිඹුරට අනුව පර්චස් දහසයක (අ. 0, රූ. 0, පර්. 16) බිම් ප්‍රමාණයකින් යුක්තව එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ සියලු දේ ද වේ.

එකී ලොට් 'ඒ ' පහත විස්තර කර ඇති ඉඩම් ඒකාබද්ධ කිරීමකි :

ඉහත කී ආකාරයට කැළණිමුල්ල පිහිටි "කෝන්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඊ. සී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1988 සැප්තැම්බර් මස 24 දිනැති අංක 1232 දරන පිඹුරෙහි ලොට් 1 ඒ ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 ඒ උතුරට : හෙන්ද්‍රික් පෙරේරාගේ ඉඩම ද, නැගෙනහිරට : පිඹුරු අංක 1593 හි ලොට් 1 බී සහ ලොට් 2 ද , දකුණට : පිඹුරු අංක 1593 හි ලොට් 2, බස්නාහිරට : ගම් සභාව පාර ද, මායිම්ව එකී අංක 1232 දරන පිඹුරට අනුව පර්චස් දහසයක (අ. 0, රූ. 0, පර්. 16) බිම් ප්‍රමාණයකින් යුක්තව එහි ඇති ගහකොළ, ගොඩනැගිලි ආදී සියලු දේ ද වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 696/93 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට කැළණිමුල්ල පිහිටි "කොන්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. පී. එල්. අබේකෝන් විසින් සාදන ලද 1994 ඔක්තෝබර් මස 14 දිනැති අංක 1734 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : ඊ. කේ. නාලිනීගේ ඉඩම ද, නැගෙනහිරට : පිඹුරු අංක 1734 හි වූ එම ඉඩමේ ම ලොට් 2 ද, දකුණට : එල්. කේ. රත්නවේලිගේ ඉඩම ද, බස්නාහිරට : ගම් සභා පාර ද, මායිම්ව එකී අංක 1734 දරන පිඹුරට අනුව පර්චස් හතක (අ. 0, රූ. 0, පර්. 07) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර, එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ සියලු දේ ද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 803/260 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. පී. දයා ගුණසිරි,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
නගර කාර්යාලය.

07-822

---

### කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 602264.
තුරුලිය ෆ්ලවර්ස්.

2013 මාර්තු මස 27 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කරන ගන්නා ලදී.

නුවරඑළිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. පී. ඩී. නානායක්කාර විසින් සහතික කරන ලද 2010 අප්‍රේල් මස 30 වැනි දින අංක 3762 දරන කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, දැන් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරය යටතේ තුරුලිය ෆ්ලවර්ස් යන නාමය හා විලාසය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන බස්නායක රන්කොත්ගේ විමලදාස සහ බ්‍රාහ්මන කංකානම්ලාගේ මාලනී යන අය බන්ධනදායින් වශයෙන් හා බස්නායක රන්කොත්ගේ විමලදාස උකස්කරු වශයෙන් ද කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස් අට ලක්ෂ හැටතුන්දාස් හතළිස් නවයයි ශත හැත්තෑ පහක් (රු. 58,63,049.75) මුදලක් 2013 ජනවාරි මස 27 වැනි දින වන විට කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් පනස් අට ලක්ෂ හැටතුන්දාස් හතළිස් නවයයි ශත හැත්තෑ පහ (රු. 58,63,049.75) ක මුදල හා 2013 ජනවාරි මස 28 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 45,06,300ක මුදලක් සඳහා වාර්ෂිකව 22% බැගින් වූ පොලිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අය කර ගැනීම සඳහා එකී අංක 3762 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය කොට්ඨාසයේ රම්බොඩ කෝරළේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක ඊ 266 කරගස්තලාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කරගස්තලාව ගමේ පිහිටි ''ග්ලෙන්ලොච් එස්ටේට්'' නමැති ඉඩමට බලයලත් මානක එම්. එම්. එන්. ටී. කේ. මාරසිංහ විසින් 2006.12.25 වැනි දින හා 2007.04.28 වැනි දින සාදන ලද අංක 1048 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් ඒ 2 නමැති ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : ලොට් සී සහ බී ගෙන් ද, නැගෙනහිරට : ලොට් බී සහ ඒ 1 න් ද, දකුණට : ලොට් ඒ 1 සහ පාරෙන් ද හා බස්නාහිරට : ලොට් ඒ 1, පාර සහ ලොට් සී ගෙන් ද යන එකී මායිම් තුළ පිහිටි අක්කර දෙකයි රූඩ් දෙකක් (අ. 02, රූ. 02, පර්. 0) විශාල ඉඩම හා එහි තුළ පිහිටි මාර්ගය පාවිච්චි කිරීමේ අයිතිය ඇතුළු අනෙකුත් සියලු දේ. මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙලුම/පත්ඉරුව කිව් 128/260 හි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

07-729

### මහජන බැංකුව - කොටිකාවත්ත ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 සැප්තැම්බර් මස 30 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට නීතිඥ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද අංක 2867 සහ 2007 නොවැම්බර් මස 07 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම අබේසිංහ ආරච්චිගේ දොන් අජිත් ප්‍රියන්ත පෙරේරා මහතා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 2867 දරන බැඳුම්කරය මත රුපියල් හාරලක්ෂ හත් දහස් අටසිය විස්සයි ශත හැත්තෑ හයක (රු. 4,07,820.76) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 3 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් හාරලක්ෂ හත් දහස් අටසිය විස්සයි ශත හැත්තෑ හයක (රු. 4,07,820.76) එකී මුදල ද, 2010.06.09 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් හාරලක්ෂ හත් දහස් අටසිය විස්සයි ශත හැත්තෑ හයක (රු. 4,07,820.76) මුදලක් මත වර්ෂයකට සියයට විසි හය (26%) බැගින් තවදුරටත් වූ පොලිය ද විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29 ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 2867 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උකස් කරන ලද දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ වැලිවිට පිහිටියාවූ ද "දිසාහේන" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු අනිල් නවගමුව විසින් සාදන ලද අංක 316 හා 1997 ඔක්තෝබර් මස 8 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 බී ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : බලයලත් මිනින්දෝරු එස්. අම්බලවනාර්ගේ අංක 25 දරන පිඹුරේ ලොට් අංක 3 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඊ. ඩී. ඕ. කොරයාගේ අංක 1008 දරන පිඹුරේ ලොට් අංක 2 ද, දකුණට : (අඩි 10ක් පළල) පාරද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 1 ඒ දරන කොටස ද, මායිම් වන්නාවූ ද, අංක 316 දරන පිඹුරට අනුව පර්චස් දහයක් (අක්. 0 රූඩ් 0 පර්. 10) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි හා වෙනත් සියලු දේත් ය.

පහත දැක්වෙන ඉඩම උඩින් තුළින් හා දිගේ මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුලත් වේ :

ඉහත කී වැලිවිට පිහිටියාවූ ද දිසාහේන යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. අම්බලවනාර් විසින් සාදන ලද අංක 25 හා 1953.09.05 දින දරන පිඹුරේ ලොට් අංක 9 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : ලොට් බී ද, නැගෙනහිරට : ලොට් අංක 8 ද, දකුණට : ලොට් අංක 10, 11, 13 හා 14 ද, බස්නාහිරට : අඩි පාර ද, මායිම් වන්නාවූ ද, එකී අංක 25 දරන පිඹුරට අනුව පර්චස් එකොළහක් (අ. 0 රූ. 0 පර්. 11) විශාල වූ ද (අඩි 8ක් පළල පාරක් සඳහා වෙන් කිරීම වන) බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1104/164, 165 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

07-811

---

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

අභීZසා සප්ලයර්ස්.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 මැයි මස 31 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යාපනය ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඉලෙන්ගෝවන් විසින් සහතික කරන ලද අංක 6281 සහ 2011 අප්‍රේල් මස 30 වැනි දින දරන සහ අංක 6282 සහ 2011 අප්‍රේල් මස 30 වැනි දින දරන උකස් බැඳුම්කර මගින් මෙහි පහත 1 වන සහ 2 වන උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය, "අභීZසා සප්ලයර්ස්" යන නාමය, විලාසය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන අරසරත්නම් ෂෙල්ටන් සහ ජෙයරාජා කිංස්ලි ජෙයජීව් (මෙහි මින් මතු "බද්ධ ණයගැණුම්කරුවන් " වශයෙන් හඳුන්වනු ලබන) යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී අරසරත්නම් ෂෙල්ටන් සහ ජෙයරාජා කිංස්ලි ජෙයජීව් (මෙහි මින්මතු "උකස්කරුවන්" වශයෙන් හඳුන්වනු ලබන), යන අය විසින් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, එකී බද්ධ ණයගැණුම්කරුවන්, එකී උකස් බැඳුම්කර මගින් ඇපයට තබන ලද එකී පහසුකම් ගෙවා පියවා දැමීම, පැහැර හැරීම සිදුකර ඇති බැවින් ද,

රුපියල් පනස් අටලක්ෂ හයදහස් තුන්සිය දොළහකුත් ශත දෙකක (රුපියල් 58,06,312.02) මුදල සහ වාර ණය පහසුකම මත 2013.04.03 වැනි දිනට මුල් හිඟ මුදල වන රුපියල් හතළිස් දෙලක්ෂ නවදහස් හත්සිය හැත්තෑ තුනකුත් ශත අනූහතක (රු. 42,09,773.97) මුදල සහ මතු දාතම කළ චෙක්පත් වට්ටම් පහසුකම මත 2013.04.03 වැනි දිනට හිඟ මුදල වන රුපියල් නවලක්ෂ තිස්පන්දහස් හාරසිය අසූපහකුත් ශත තිස්එකක (රු. 9,35,485.31) මුදල මත (මාසික විරාම සහිත වැල්පොළී පදනමින්) 2013.04.04 දින සිට තවදුරටත් පොලිය ද, ඊට සම්බන්ධ

අනෙකුත් ව්‍යවස්ථාපිත අයකිරීම් සහ ප්‍රචාරක වියදම් ද, තදනන්තරව ගෙවා ඇති මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනවල දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ, ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### 1 වැනි උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, උතුරු මන්මුනෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මන්මුනෙයි පත්තුවේ මඩකලපුව මහ නගර සභා සීමාවේ නාගරික කොට්ඨාස අංක එස්යූ - 6 ඇතුළත නවට්කර්නි ගමේ පිහිටි, පෙච්චිඅම්මාන් කෝවිල පාරේ වරිපනම් අංක 69/1 දරන, බලයලත් මිනින්දෝරු ඒ. ඊ. කේ. තිසේවීරසිංහ විසින් මැන සාදන ලද අංක 830/2010 සහ 2010 ඔක්තෝබර් මස 12 වැනි දිනැති පිඹුර ප්‍රකාර "පනෙයියඩි වලවු, එළුවෙනෙයි වලබු, මරුදයඩි වලවු, වෙනෙයි වලවු සහ පොන්නක්කා වලවු"නමැති බෙදා වෙන්කළ ඉඩමට මායිම් නැගෙනහිරට : අංක එම්. එන්. 383 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 10 ද, උතුරට : එම්. එන්. 383 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 5 ද, බස්නාහිරට : අඩිපාර ද, දකුණට : අංක 1239/2006 දරන පිඹුරේ කැබලි අංක 2 ද, යන මායිම් තුළ පිහිටි රූඩ් තුනකුත් පර්චස් තිස්හතයි දශම පහක් (අ. 0, රූ. 3, පර්. 37.5) නොහොත් හෙක්ටයාර් 0.3984 ක් විශාල ඉඩම සහ ඊට අයිති සියලුම අයිතිවාසිකම් ද සමඟ ය. මෙම දේපළ මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 659/83 සහ ජීඑම් 21/73 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

### 2 වැනි උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ උතුරු මන්මුනෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මන්මුනෙයි පත්තුවේ මඩකලපුව මහ නගර සභා සීමාවේ නාගරික කොට්ඨාස අංක එස්යූ - 6 ඇතුළත නවට්කර්නි ගමේ පිහිටි, පෙච්චිඅම්මාන් කෝවිල පාරේ වරිපනම් අංක 63/18-63 /23 සහ 63ඊ දරන "පනෙයියඩි වලවු, එළුවෙනෙයි වලබු, මරුදයඩි වලවු, වෙනෙයි වලවු සහ පොන්නක්කා වලවු" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඊ. කේ. තිසේවීරසිංහ විසින් මැන සාදන ලද අංක 993/2010 සහ 2010 නොවැම්බර් මස 25 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අංක 16, 17, 18, 19, 20, 21 සහ 22 යන ඉඩම් කැබලිවලට මායිම් නැගෙනහිරට : පාර ද, උතුරට : පාර ද, බස්නාහිරට : තිරෙයිමඩු දක්වා දිවෙන අඩිපාර ද, දකුණට : නවට්කර්නි දක්වා දිවෙන අඩිපාර ද, යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකකුත් පර්චස් විසිපහයි දශම දෙකයි තුනක් (අ. 0, රූ. 02, පර්. 25.23) විශාල ඉඩම සහ ඊට අයිති සියලුම අයිතිවාසිකම් ද සමඟ ය. මෙම දේපළ මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 727/239 සහ ජීඑම් 21/72 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජ සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

07-758
A2 – B 80750

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - ග්‍රෑන්ඩ්පාස් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

විජයසිරි ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2013 ජූනි මස 27 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද 2010 ඔක්තෝබර් මස 25 වැනි දින අංක 1072 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විජයසිරි ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි අසූනවලක්ෂ පනස්හයදාහස් එකසිය දහයයි ශත දහතුන (රු. 18,956,110.13) ක මුදලක් 2013 අප්‍රේල් මස 25 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 18,956,110.13 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 අප්‍රේල් මස 26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 1072 දරන බැඳුම්කරය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩී. කෙලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව තුළ නාවල පිහිටි කොස්වත්තේ 2 වැනි පටුමගේ වරිපනම් අංක 30/7 දරන මීගහවත්ත නොහොත් කැටකැලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් 1994 මැයි 29 වැනි දින මැන සාදන ලද අංක 2935 දරන පිඹුරෙන් බෙදා වෙන්කළ ලොට් සී වශයෙන් දැක්වෙන ඉඩම් කොටස වන උතුරට : ලොට් බී ද, නැගෙනහිරට : ඇලන් පෙරේරා මහත්මියට අයිති ඉඩමෙන් ද දකුණට : පිඹුරු අංක 616 ලොට් 16 සහ බස්නාහිරට : අංක 616 දරන පිඹුරේ ලොට් 14 (පාර) න් ද, මායිම් වූ එකී අංක 2935 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහළොව (අ. 0 රූ. 0 පර්. 15) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1760/233 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම මෑතක දී මැන බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් 2010 ඔක්තෝබර් මස 11 වැනි දින මැන සාදන ලද අංක 11288 පිඹුර අනුව මෙසේ විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව තුළ නාවල පිහිටි කොස්වත්තේ 2 වැනි පටුමගේ වරිපනම් අංක 30/7 දරන මීගහවත්ත නොහොත් කැටකැලගහවත්ත නමැති ඉඩමෙන් බෙදාවෙන් කළ ලොට්

එක්ස් වශයෙන් හැඳින්වෙන ඉඩම් කොටස වන උතුරට : පාර, (පිඹුරු අංක 616 හි ලොට් 14) ද, සහ අංක 2935 දරන පිඹුරේ ලොට් බී වලින් ද, නැගෙනහිරට : පිඹුරු අංක 2935 දරන පිඹුරේ ලොට් බී සහ ඇලන් පෙරේරාගේ ඉඩමෙන් ද, දකුණට : ඇලන් පෙරේරාගේ ඉඩම සහ ඩී. අබේසුන්දරගේ ඉඩමෙන් ද, සහ බස්නාහිරට : ඩී. අබේසුන්දරගේ ඉඩම සහ පාර (පිඹුරු අංක 616 හි ලොට් 14) ද මායිම් වූ අංක 11288 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහළොව (අ. 0, රූ. 0, පර්. 15) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

එකී අංක 1072 දරන උකස් බැඳුම්කරයේ දෙවැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ප්‍රවේශ මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-825/1

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කිරිඳිවෙල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගනේඅච්චි පතිරැන්නැහැලාගේ ඉනෝකා අසංගි සහ ගනේඅච්චි පතිරැන්නැහැලාගේ දයානන්ද.

2013 ජුනි මස 27 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ ද 2008 නොවැම්බර් මස 25 වැනි දින අංක 7151 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගනේඅච්චි පතිරැන්නැහැලාගේ ඉනෝකා අසංගි සහ ගනේඅච්චි පතිරැන්නැහැලාගේ දයානන්ද යන අය ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිහතරලක්ෂ තිස්එක්දහස් හත්සිය හැටඑකයි ශත විසිතුන (රු. 2,431.761.23) ක මුදලක් 2013 මැයි 01 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 2,431,761.23 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 මැයි 02 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 7151 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ උඩුගහ පත්තුවේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ මොගොඩපොත උප කාර්යාලය, තුළ හප්පිටිය පිහිටි මීගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. හියුබට් පෙරේරා විසින් පිළියෙල කරන ලද 1995 ජනවාරි මස 06 වැනි දිනැති අංක 5614 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 3 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස වන උතුරට : කේ. ජයවර්ධනගේ ඉඩම, ජී. පී. සුමිත්‍රා හිමිකම් කියන මීගහවත්ත ඉඩම, ගම්සභා පාර සහ ජී. පී. මංගනෝනාට අයිති මීගහවත්ත ඉඩමෙන් ද, නැගෙනහිරට : කලින් ජී. පී. පුංචිසිංඤෝ සහ තවත් අයට අයිති සහ දැනට ජී. පී. දබිලින් අප්පුහාමිට අයිති ඉඩම කලින් ජී. පී. සාදිරිස් සිංඤෝ සහ තවත් අයට අයිති දැනට ජී. පී. කුලතුංගට අයිති ඉඩම සහ කලින් සාදිරිස්ට අයිති දැනට ජී. පී. ගුණතිලකට අයිති ඉඩමෙන් ද, දකුණට : කලින් සාදිරිස්ට සහ දැනට ජී. පී. ගුණතිලකට අයිති ඉඩම සහ තවත් කැබලි සහ බස්නාහිරට : ජී. පී. නවරත්නගේ ඉඩම, කේ. ජයවර්ධනගේ ඉඩම. ජී. පී. සුමිත්‍රාට අයිති මීගහවත්ත ගම්සභා පාර සහ ලොට් 1 සහ 2න්ද, මායිම්වූ එකී අංක 5614 දරන පිඹුර ප්‍රකාරව විශාලත්වයෙන් අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් දොළහයි දශම හය (අ. 2, රූ. 2, පර්. 12.6) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය ගම්පහ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව එෆ් 179/183 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී ඉඩම බලයලත් මිනින්දෝරු අයි. කොටම්බගේ විසින් 2008ක් වූ ජූලි මස 19 වැනි දින මැතකදී මැන සාදන ලද අංක 226එච්/2008 දරන පිඹුරට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ උඩුගහ පත්තුවේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ මෙගොඩපොත උප කාර්යාලය තුළ හප්පිටිය පිහිටි මීගහවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස වන උතුරට : පාර සහ ජී. පී. සුමිත්‍රා ජී. පී. මංගනෝනා යන අය හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : ජී. පී. දබිලින් අප්පුහාමි ජී. පී. කුලතුංග සහ ජී. පී. ගුණතිලක යන අය හිමිකම් කියන ඉඩම් ද, දකුණට : ජී. පී. ගුණතිලක සහ ජී. පී. නවරත්න හිමිකම් කියන ඉඩම් වලින් ද, සහ අංක 5614 දරන පිඹුරේ ලොට් 1 සහ 2 සහ බස්නාහිරට : ජී. පී. නවරත්න සහ ජී. පී. සුමිත්‍රා හිමිකම් කියන ඉඩම්වලින් ද, පාරෙන් ද මායිම් වූ එකී අංක 226එච්/2008 පිඹුර ප්‍රකාරව විශාලත්වයෙන් අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් දොළහයි දශම හය (අ. 2, රූ. 2, පර්. 12.6) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-825/2

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - බම්බලපිටිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වීරසිංහ ආරච්චිගේ දුමින්ද කුමාර වීරසිංහ

2013 ජූනි මස 27 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2011 ජූනි 24 වැනි දින සහතික කළ අංක 1274 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වීරසිංහ ආරච්චිගේ දුමින්ද කුමාර වීරසිංහ යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි පනස් අටලක්ෂ අසූනමදාහස් දෙසිය හැටදෙකයි ශත විසිඅට (රු. 15,889,262.28) ක මුදලක් 2013 පෙබරවාරි මස 27 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 15,889,262.28 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 පෙබරවාරි මස 28 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 1274 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව තුළ නුගේගොඩ ගංගොඩවිල පිහිටි සන්තානම්පිටිය පාරේ වරිපනම් අංක 35 දරන පෙලෙන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් 1997 ඔක්තෝබර් මස 17 වැනි දින මැන සාදන ලද අංක 3533 දරන පිඹුරෙන් බෙදා වෙන්කළ ලොට් 4 වශයෙන් හැඳින්වෙන ඉඩම් කොටස වන උතුරට : ලොට් 3න් ද, නැගෙනහිරට : ලොට් 6න් ද, දකුණට : ලොට් 5න් ද, සහ බස්නාහිරට : සන්තානම්පිටිය පාරෙන් ද, මායිම් වූ එකී අංක 3533 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහයි දශම නමයයි හය (අ. 0, රූ. 0, පර්. 12.96) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2215/229 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-825/3

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - ගාල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

අන්ගුලුගහ ගමගේ සරත් ගාමිණී.

2013 ජූනි මස 27 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එස්. මරික්කාර් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2005 මැයි මස 12 වැනි දින සහතික කළ අංක 9754, 2007 අගෝස්තු මස 29 වැනි දින සහතික කළ අංක 10515 සහ 2008 සැප්තැම්බර් 26 වැනි දින සහතික කළ අංක 10862 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අන්ගුලුගහ ගමගේ සරත් ගාමිණී ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් එක්කෝටි හතලිස් අටලක්ෂ පනස්හයදාහස් අටසිය හැටහයයි ශත තිස් දෙක (රු. 14,856,866.32) ක මුදලක් 2013 පෙබරවාරි මස 26 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 14,856,866.32 ක මුදල අයකර ගැනීම සඳහා 2013 පෙබරවාරි මස 27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 9754, 10515 සහ 10862 දරන උකස් බැඳුම්කර යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩී. කෙලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### උපලේඛනය

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, උතුරු තල්පේ පත්තුවේ, මලල්ගොඩපිටිය හි පිහිටි ඒකාබද්ධව පිහිටි ලොට් අංක 2, 3 සහ 4 එම ලොට් අංක 1 කොටස දරන වැව ආරච්චිගේ අද්දරදූව (ටී. පී. 226549 සහ ටී. පී. 226550) සහ කිරිහාමිනේදූව (ටී. පී. 226551 සහ ටී. පී. 226552) කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. වීරසිංහ විසින් 2004 මාර්තු 30 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 265 ඒ හි ලොට් සී වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : එම ඉඩමේ ම සලකුණු කරන ලද ලොට් බී ද, නැගෙනහිරට : එම ඉඩමේ ම ලොට් අංක 1 නැවත බෙදූ ලොට් අංක 05 ද, දකුණට : හොපේ සිට වල්පොල දක්වා ගම් සභා පාර ද සහ බස්නාහිරට : එම ඉඩමේ ම සලකුණු කරන ලද ලොට් බී සහ ඩී ට මායිම් වූ රූඩ් එකයි, පර්චස් තිස්හතයි, දශම දෙකයි පහ (අ. 0 රූ. 1 පර්. 37.25) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග පස, ගහකොළ, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ. මෙය ගාල්ල දිසා අධිකරණයේ නඩු අංක පී 11763 යටතේ ගොනු වී ඇත.

2. ඉහත කී උතුරු තල්පේ පත්තුවේ මලල්ගොඩපිටිය හි පිහිටි ඒකාබද්ධව පිහිටි ලොට් අංක 2, 3 සහ 4 එම ලොට් අංක 1 කොටස දරන වැව ආරච්චිගේ අද්දරදූව (ටී. පී. 226549 සහ ටී. පී. 226550) සහ කිරිහාමිනේදූව (ටී. පී. 226551 සහ ටී. පී. 226552) කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. වීරසිංහ විසින් 2004 මාර්තු මස 30 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 265 ඒ හි ලොට් ඞී වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : සහ නැගෙනහිරට : එම ඉඩමේ ම ලොට් සී ද, දකුණට : හොපේ සිට වල්පොල දක්වා ගම් සභා පාර ද, සහ බස්නාහිරට : එම ඉඩමේ ම සලකුණු කරන ලද ලොට් බී සහ සීට මායිම් වූ පර්චස් දෙකයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 02.75) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග පස, ගහකොළ, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ. මෙය ගාල්ල දිසා අධිකරණයේ නඩු අංක පී. 11763 යටතේ ගොනු වී ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-825/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.